# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2186/27 - 2020 ජූලි මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2020.07.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv)(A).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු, 27(1) වන වගන්තිය යටතේවන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන, ශ්‍රී ලංකාවේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, (2020 පෙබරවාරි මස 27 වැනි දින අංක 2164/53 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත පරිදි වූ) 2009 මැයි මස 28 වැනි දින අංක 1603/35 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :

(1) එකී උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "වෛද්‍ය විද්‍යා පීඨය" යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන "16. වෛද්‍ය අධ්‍යයන සහ සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීමෙන්:

"17. ප්‍රතිශක්ත විද්‍යා හා අණුක වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය"; සහ

(2) එකී උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය" යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන "15. සංගීතමය හා නිර්මාණාත්මක තාක්ෂණවේද අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීමෙන්:

"16. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අධ්‍යයන අංශය".

**අචාර්ය බන්දුල ගුණවර්ධන,**
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 ජූලි මස 30 වැනි දින,
කොළඹ දී ය.

08-299


1A - PG 5077 - 518 (2020/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.